කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

බාහිර විභාග අංශය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ද්විතීය පරීක්ෂණය (බාහිර) - 2010
2012 ජනවාරි / පෙබරවාරි

මානවශාස්ත්‍ර පීඨය

සිංහල - SINH E2025

සංස්කෘතිය, ජනශ්‍රැතිය හා භාෂා අධ්‍යයනය

**1 කොටසින් එක් ප්‍රශ්නයක්ද, 11 කොටසින් එක් ප්‍රශ්නයක්ද, 111 කොටසින් ප්‍රශ්න දෙකක්ද ඇතුළත් වන සේ ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.**

ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි. කාලය : පැය 03 යි.

---

## 1 කොටස

01. 'සංස්කෘතිය වනාහි මිනිසා තමාට හිතකර අයුරින් ස්වභාවධර්මය වෙනස්කර ගැනීමෙහි ලා දරූ ප්‍රයත්නයන්හි ප්‍රතිඵල සමස්තයයි.'' විභාග කරන්න.

02. පෘතුගීසි හා ලන්දේසි ආක්‍රමණ හේතුකොට ගෙන සිංහල සංස්කෘතියෙහි ඇතිවූ වෙනස්කම් කවරේද'යි උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

03. ජනප්‍රිය සංගීතය මගින් සිංහල සංස්කෘතිය කෙරෙහි කෙබඳු බලපෑමක් ඇති කෙරේද'යි ඔබේ අත්දැකීම් ද ඇසුරු කොට ගනිමින් විමර්ශනය කරන්න.

**නැතහොත්**

පහත සඳහන් මාතෘකා අතරින් **දෙකක්** පිළිබඳ විචාර පූර්වකව අදහස් දක්වන්න.

අ) නාගරික උපසංස්කෘතිය
ආ) ගණාචාර
ඇ) ශ්‍රී ලාංකේය වාරිකර්මාන්තය
ඈ) අභෞතික සංස්කෘතිකාංගයක් වශයෙන් සාහිත්‍යයෙහි ඇති වැදගත්කම

## 11 කොටස

04. 'ජනශ්‍රැති අධ්‍යයනයෙහි පරමාර්ථය වූ කලී ජනජීවිතය හැදෑරීම ය.' මේ ප්‍රකාශයෙහි යුක්තියුක්තතාව නිදර්ශනාත්මකව පරීක්ෂා කරන්න.

05. 'සිංහල ජනකථාවල ඇතුළත් චරිත හා සිද්ධි පමණක් නොව යෙදුම් පවා පැරණි ගැමි ජීවිතය පිළිබිඹු කොට දක්වයි.' මේ ප්‍රකාශය නිදසුන් සහිතව විභාග කරන්න.

06. ශ්‍රී ලාංකේය කෘෂිකාර්මික ජනසමාජයේ මානව සම්බන්ධතා පිළිබිඹු කෙරෙන ජනශ්‍රැති අංගයක් වශයෙන් සිංහල ජනකවිය කෙසේ අගය කළ හැකි ද'යි නිදර්ශනාශ්‍රයෙන් විග්‍රහ කරන්න.

**නැතහොත්**

පහත සඳහන් මාතෘකා අතරින් එකක් විමර්ශනයට පාත්‍ර කරන්න.

අ) සිංහල ජනවහර
ආ) ලක්දිව ජන ඇදහිලි
ඇ) හේන් ගොවිතැන ආශ්‍රිත ජනකවි

**111 කොටස**

07. විවිධ භාෂා පවුල් පිළිබඳ හැඳින්වීමක් කොට සිංහලය ඉන් කිනම් භාෂා පවුලකට අයත් වේ ද'යි නිදසුන් සහිතව පිරික්සන්න.

**නැතහොත්**

සිංහලය ද්‍රාවිඩීය භාෂා පවුලට අයත් යැ'යි ඇතැම් විද්වතුන් කරන ප්‍රකාශයන්ට පදනම් වූ කරුණු පිළිබඳ සමාලෝචනයක යෙදෙන්න.

08. අර්ථානුගත ලිංග භේදය හා ව්‍යාකරණානුගත ලිංග භේදය හඳුන්වා සිදත්සඟරාවේ ලිංග වර්ගීකරණය පිළිබඳ විවේචනාත්මක විග්‍රහයක් කරන්න.

**නැතහොත්**

විභක්ති යනු කුමක්දැයි හඳුන්වා නාම වරනැගීමේ දී විභක්ති ප්‍රත්‍යයන්ට වඩා විභක්ති අර්ථසූචක පදයන්ගෙන් ලබා දෙන දායකත්වය පිළිබඳ විමසීමක් කරන්න.

09. කාරක විභක්ති හා අකාරක විභක්ති පිළිබඳ හැඳින්වීමක් කොට අර්ථ සම්පන්න වාක්‍ය සම්පාදනයේ දී ක්‍රියාව හා කාරක අතර පවත්නා අන්‍යෝන්‍ය සම්බන්ධය පහදන්න.

10. ක්‍රියාව හා ආඛ්‍යාතය අතර වෙනස පැහැදිලි කොට අනාගත කාලික ක්‍රියා රූපය පිළිබඳ සිදත්සඟරාවේ ඉගැන්වීම් විමර්ශනය කරන්න.

**************************